අග්‍රාමාත්‍ය කාර්යාලය
பிரதம அமைச்சரின் அலுவலகம்
PRIME MINISTER'S OFFICE

58, ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත, කොළඹ 07.
58, ஸ்ரீமத் ஏர்னஸ்ட் த சில்வா மாவத்தை, கொழும்பு 07.
58, Sir Ernest de Silva Mawatha, Colombo 07.
Web : www.pmoffice.gov.lk

PTF/01/Circular/01
2021.04.10

චක්‍රලේඛ අංකය : PTF/03-2021

**සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් / දිසාපතිවරුන්**
**සහ ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත**

**කොවිඩ් - 19 ව්‍යසනකාරී තත්ත්වය නිසා බලපෑමට ලක් වූ පවුල්වලට රු.5000/-ක දීමනාවක් ගෙවීම**

රටේ පැවති හා පවතින කොවිඩ් -19 ව්‍යසනකාරී තත්ත්වය නිසා බලපෑමට ලක් වූ පහත සඳහන් පවුල්වලට ඔවුන්ට ලැබෙන මාසික දීමනාවට අමතරව එක් වරක් පමණක් රු. 5000/-ක දීමනාවක් ගෙවීමට රජය තීරණය කර ඇත. මෙහිදී අවසන් වරට රු.5000/- දීමනාව ගෙවූ පවුල් කාණ්ඩ 10 අතුරින් පහත සඳහන් කාණ්ඩ 7ට අයත් පවුල්, ප්‍රතිලාභී පවුල් වශයෙන් තෝරාගෙන ඇත.

I. සමෘද්ධිලාභී පවුල්
II. අඩු ආදායම්ලාභීන් ලෙස හඳුනාගෙන ඇති පවුල්
III. වැඩිහිටි දීමනාව ලබන පුද්ගලයන් සිටින පවුල්
IV. ආබාධිත දීමනාව ලබන පුද්ගලයන් සිටින පවුල්
V. වකුගඩු රෝගී තත්ත්වය හේතුවෙන් දීමනාව ලබන පුද්ගලයන් සිටින පවුල්
VI. සියවස් පූර්ණ වැඩිහිටි දීමනාව ලබන පුද්ගලයන් සිටින පවුල්
VII. අභියාචනා ඉදිරිපත් කර සුදුසුකම් ලැබූ පවුල්
(ඉහත සඳහන් පවුල් කාණ්ඩ 6 යටතේ අභියාචනා ඉදිරිපත් කර ප්‍රතිලාභ ලැබීමට සුදුසුකම් ලැබූ පවුල් පමණි.)

02. මෙම දීමනාව ගෙවීමේ දී ඉහත සඳහන් ප්‍රතිලාභීන් සිටින පවුලකට එක් රු.5000/-ක් පමණක් ලැබෙන සේ ගෙවිය යුතු ය. උදාහරණයක් වශයෙන් යම් පවුලක් සමෘද්ධි හිමිකම් ලැබේ නම් සහ වැඩිහිටි දීමනාව ලැබීමට සුදුසුකම් ලබන පුද්ගලයෙක් වේ නම්, මෙම චක්‍රලේඛය යටතේ එම පවුලට එක් රු.5000/- දීමනාවක් පමණක් ගෙවිය යුතු ය.

03. මෙම දීමනා ගෙවීමේ දී ප්‍රතිලාභී පවුල් හඳුනාගැනීම සඳහා මා විසින් නිකුත් කර ඇති චක්‍රලේක අංක PTF/03-2020, PTF/03/2020(i), PTF/03/2020(ii), PTF/03/2020(iii), PTF/03/2020(iv) මඟින් දැනටමත් හඳුනාගෙන ඇති ඉහත සඳහන් පවුල් කාණ්ඩ 7 සඳහා පමණක් දීමනාව ලැබීමට සුදුසුකම් ලබයි. ඡන්ද හිමි නාම ලේඛනයේ එක් ගෘහ මූලික අංකයක් යටතේ ලියාපදිංචි වී සිටියද, එම ගෘහ මූලික ඒකකයේ ප්‍රධාන පවුල් ඒකකයට අමතරව එක් අනු පවුලක් හෝ ඊට වැඩි ගණනක් සිටී නම් ඔවුන්ව අංක PTF/03/2020 (iv) හා 2020.04.20 දිනැති චක්‍රලේඛය අනුව හඳුනාගෙන ඇති බැවින්, එම අනු පවුල්වලට ද රු.5000/- දීමනාව හිමි වේ. එම චක්‍රලේඛය නිකුත් කිරීමෙන් පසුව අනු පවුල්වලට බෙදී ඇති විට ඒ සම්බන්ධ අවසාන තීරණය ප්‍රාදේශීය ලේකම් විසින් ගත හැකිය.

04. මෙම දීමනාව ගෙවීම සඳහා සමෘද්ධි සංවර්ධන නිලධාරීන් මෙන් ම, ප්‍රාදේශීය ලේකම් විසින් තීරණය කරනු ලබන වෙනත් සුදුසු නිලධාරීන් සහභාගී කරගෙන අදාළ දීමනාව කඩිනමින් ප්‍රතිලාභීන් වෙතට සෞඛ්‍ය නීති රීති අනුගමනය කරමින් ලබා දීමට කටයුතු කළ යුතු ය.

05. අංක PTF/03/2020 (ii) හා 2020.04.15 දිනැති චක්‍රලේඛයේ ඇමුණුම-01හි කාර්යාලීය ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කර ඇති ආකෘතියට ගැළපෙන ආකාරයට ප්‍රතිලාභියා රු.5000/- දීමනාව ලබාගත් බවට සහතිකයක් ලබාගැනීමට කටයුතු කිරීම අත්‍යවශ්‍ය වේ.

සිංහල හා හින්දු අලුත් අවුරුදු සමයේ මහජනතාව මුහුණ පා ඇති දුෂ්කරතා සමනය කොට ඔවුන්ගේ ජන ජීවිතය යථාවත් කර ගැනීම සඳහා මෙම සමාජ ප්‍රතිලාභ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ඔබ දක්වන සහාය කෘතවේදීව අගය කරමි.

අත්. කළේ ගාමිණී එස්. සෙනරත්
අග්‍රාමාත්‍ය ලේකම්

ඇන්ටන් පෙරේරා
අග්‍රාමාත්‍ය අතිරේක ලේකම්
සම ලේකම්, ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාවය තුරන් කිරීම
සඳහා වන ජනාධිපති කාර්යසාධන බලකාය

පිටපත්:

01. ජනාධිපති ලේකම්
02. අමාත්‍ය මණ්ඩල ලේකම්
03. විගණකාධිපති
04. ලේකම්, මුදල් අමාත්‍යාංශය

} කාරුණික දැන ගැනීම සඳහා

05. ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය
06. ලේකම්, ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය
07. ලේකම්, සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
08. ලේකම්, ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය
09. අධ්‍යක්ෂ ජනරාල්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
10. අධ්‍යක්ෂ, ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය
11. අධ්‍යක්ෂ, ආබාධ සහිත තැනැත්තන් පිළිබඳ මහලේකම් කාර්යාලය

} අවශ්‍ය කටයුතු සඳහා

- චක්‍රලේඛය පිළිබඳ වැඩිදුර පැහැදිලි කරගැනීම් අවශ්‍ය වෙතොත්; කේ.ප්‍රසන්න චන්දිත් මහතා - ජ්‍යෙෂ්ඨ සම්බන්ධීකාරක, ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්යසාධන බලකාය
077 3641563